# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

## PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

ෆයිසර් මුස්තාපා මැතිතුමා, 2017.10.16

ගරු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය,

අංක. 330 ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත,

කොළඹ 02

ගරු අමාත්‍යතුමනි,

**පළාත් පාලන සංස්ථාපන ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කිරීම**

මහනගර සභා, නගර සභා ප්‍රාදේශිය සභා ආඥාපනත් සංශෝධනයට අදාල පනත් කෙටුම්පත ගරු කථානායක තුමන්ගේ අත්සන යෙදූ වහාම සංශෝධනයට අදාල ගැසට් පත්‍රයේ දළ සැකැස්ම මැතිවරණ කොමිෂන් සභාවේ අවධානයට යොමු කිරීම පිලිබඳව අප ස්තූතිවන්ත වෙමු.

එහෙත් මැතිවරණ කොමිෂන් සභාවට මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමේ හැකියාව ලැබෙනුයේ විෂය භාර අමාත්‍යවරයා ලෙස ඔබතුමන් ඒ ඒ පළාත් පාලන ආයතන වල සහික ධූර ප්‍රමාණ නිශ්චිත කරමින් සංස්ථාපන ගැසට් පත්‍රය ප්‍රකාශ කිරීමෙන් අනතුරුවය.

එබැවින් අප ඔබතුමන්ගෙන් ඉල්ලා සිටින්නේ පළාත් පාලන මැතිවරණයට අදාල අවසන් බාධකයද ඉවත් කරමින් සංස්ථාපන ගැසට් පත්‍රය මෙම සතිය තුළ නිකුත් කර මේ රටේ මිලියන 15 පමණ වන ඡන්ද දායකයන්ට තම පළාත් පාලන නියෝජිතයන් තෝරා ගැනීමට ඉඩකඩ සලසන ලෙසයි.

මෙයට,
විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂක

පිටපත - මහින්ද දේශප්‍රිය මැතිතුමා, සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
උනන්දුවක් දක්වන සෙසු ආයතන

# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.
Tel: (+94) 11 2514441 / 11 2514442 Fax: (+94) 11 2514443
E-Mail: paffrel@sltnet.lk Website: www.paffrel.lk

Scanned by CamScanner